# Abstract No 67

## හින්දු දහමේ දේවතාවියන් පිළිබඳ අධ්‍යයනයක්

**ඉෂාරා මදුෂානි,**
විශේෂවේදී තෙවන වසර, පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
isharamadushani41@gmail.com

හින්දු දර්ශනය අනුව මුළු මහත් විශ්වය තුළ ද එයට පිටතින් ද ඇත්තේ එක ම මහාදේව බලයක් පමණි. එය බ්‍රහ්මන් - ආත්මන් නමින් හැඳින්වේ. හින්දු ආගම දේව විශ්වාසය පදනම් කරගත් ආගමක් වුව ද ඒ දේව විශ්වාසය බැතිමතුන් විසින් විස්තර කරනු ලබන විලාශය හැමවිට ම ඒකාකාර නොවේ. ඇතැම්හු එක ම දෙවි කෙනෙකු පිළිගනිති. ඇතැම්හු දෙවි දේවතාවන් සමූහයක් අදහති. හින්දු ආගමේ පවත්නා දේව සංකල්පය මෙන් ම දේවතාවියන් වන්දනාමාන කිරීම ද ප්‍රධාන වැදගත්කමකින් යුතු චාරිත්‍රයක් බවට පත් ව තිබේ. හින්දු දේවතාවියන් අතර ප්‍රධාන තැනක් ගනු ලබන සරස්වතී, පාර්වතී, ලක්ෂ්මී, දුර්ගා සහ කාලි වැනි දේවතාවියන් මෙන් ම ප්‍රාදේශීය වශයෙන් වැඳුම් පිදුම් කරන දේවතාවියන් ද රාශියක් දක්නට හැකි ය. මුල් කාලීන ව ශිව, විෂ්ණු දේව වන්දනය ප්‍රධාන වශයෙන් ප්‍රචලිත ව පැවතිය ද ඔවුන්ගේ ශක්තීන් වූ දේවතාවියන් වන්දනයට එතරම් සැලකිල්ලක් තිබුණේ නැත. නාමික ව පමණක් ඔවුන්ට වටිනාකමක් හිමි වූයේ දෙවියන්ගේ භාර්යාව ලෙසට පමණ ය. නමුත් ගුප්ත යුගය වන විට දේවතාවියන් වන්දනය බොහෝ සේ ඉදිරියට පැමිනුණේ ය. වර්තමානය දක්වා ම හින්දු ආගමික ජනයා දෛනික අපේක්ෂා හා සෞභාග්‍ය උදාකර ගැනීම උදෙසා මෙම දේවතාවියන් වන්දනය සිදු කරනු ලබයි. හින්දු දේවතාවියන් අතර සරස්වතී, පාර්වතී, ලක්ෂ්මී වැනි දේවතාවියන්ගේ උත්පත්තිය, ස්වභාවය මෙන් ම ලක්ෂණයන් ද ඉදිරිපත් කර පෙන්වීම මෙහි ප්‍රධාන අරමුණ කොට ගැණේ. හින්දු දේවතාවියන්ගේ චාරිත්‍රයන්හි පවත්නා විවිධ ලක්ෂණයන් පිළිබඳ දැනුමක් බෞද්ධ ජනතාවටත් ලබාදීම මෙහි දී අපේක්ෂිත අරමුණකි. හින්දු ආගමේ සඳහන් දේවතාවියන් සම්බන්ධයෙන් සිදු කෙරෙන මෙම පර්යේෂණයේ දී භාවිත කොට ගත් මූලාශ්‍රය ලෙසට ද්විතීයික මූලාශ්‍රය මෙන් ම ඓතිහාසික කැටයම් හා ජන වහර ද විශේෂ වේ. වර්තමානය වන විට හින්දු ජන සමාජයේ පිරිස් මෙන් ම සිංහල බෞද්ධ ජන පිරිස ද මෙම දේවතාවියන් වන්දනාමානයට ලක් කරති.

**ප්‍රමුඛ පද -** හින්දුදහම, දේවතාවියන්, පාර්වතී, ලක්ෂ්මී, සරස්වතී